# පටනංගල සංචාරක මධ්‍යස්ථානය ඉදි කිරිම සම්බන්ධව මහජන අදහස් ලබා ගැනීම සදහා පැවති රැස්වීම

දිනය-:2021.02.19 වේලාව -: පෙ.ව.10.30 ස්ථානය -: යාල ජාතික උද්‍යානය

සහභාගී වූ නිලධාරින් -:01. අධ්‍යක්ෂ (මෙහෙයුම්) - රන්ජන් මාරසිංහ මහතා

02. ලෝක බැංකු නියෝජනය කරන ලද - ආචාර්ය පිලපිටිය මහතා

03.ව්‍යාපෘති සම්බන්ධීකාරක - ආචාර්ය ලක්ෂ්මන් පීරිස් මහතා

04.ව්‍යාපෘති කළමණාකරු - ධනුෂ්ක මහතා

05.සහකාර අධ්‍යක්ෂ (ඌව) - ඩබ්.ඒ.ඒ.ඩී.යූ.ඉන්ද්‍රජිත් මහතා

06.වාස්තු විද්‍යා උපදේශක - ඉසුරුද සොයිසා මහතා

07.උද්‍යාන භාරකරු (යාල) - වී.කේ.එම්.විද්‍යාරත්න මහතා

බාහිර සහභාගීත්වය

08.වෙරළ සංරක්ෂණ සහකාර අධ්‍යක්ෂ ප්‍රමුඛ කාර්යය මණ්ඩලය

09.යාල ජාතික උද්‍යාන වනජීවී කාර්ය මණ්ඩල නිලධාරීන්

10.සංචාරක හෝටල් කළමණාකාරිත්වය හා සේවකයින්

11.සෆාරි ජීප්රථ සංගම්හි නිලධාරීන්/ සෆාරි ජීප්රථ හිමියන් හා රියදුරන්

12.ජනවිභිදුම්කරණ සමිති නියෝජනය

13.ස්වේච්ඡා මාර්ගෝපදේශකයින්

14.පලටුපාන ලුණු ලේවාය - නිලධාරීන්

ව්‍යාපෘති සම්බන්ධීකාරක ආචාර්ය ලක්ෂ්මන් පීරිස් මහතා විසින් සාකච්ඡාවට පැමිණි සියළුම දෙනා පිළිගනිමින් සාකච්ඡාව ආරම්භ කරන ලද අතර පැමිණි සිටින පාර්ශවයන් වෙන් වෙන් වශයෙන් හදුනා ගන්නා ලදි.

එහිදී ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ESCAMP ව්‍යාපෘතිය යටතේ සැලසුම් කරන ලද යාල ජාතික උද්‍යානයේ පටනංගල සංචාරක සේවා මධ්‍යස්ථානය ඉදි කිරීම සම්බන්ධයෙන් මහජන අදහස් විමසීම වෙනුවෙන් මෙම සාකච්ඡාව පැවැත්වෙන බවත් සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ විවිධ පාර්ශව මේ වෙනුවෙන් සහභාගී වීම ඉතා වැදගත් බව ප්‍රකාශ කරන ලදි.

## වාස්තු විද්‍යා උපදේශක - ඉසුරු ද සොයිසා මහතා

- මෙහිදී පටනංගල විවේකී ස්ථානයේ සංචාරක මධ්‍යස්ථානයක් විවෘත කිරීම මූලිකවම අරමුණ විය.

- එහි මූලික සැකැස්ම පිළිබඳව මෙම මධ්‍යස්ථානයෙන් සිදුවන සේවාව පිලිබඳව වාස්තු විද්‍යාඥ ඉසුරු මහතා විසින් පැහැදිලි කරන ලදි.

- එහිදී ප්‍රධාන වශයෙන් ක්‍රමවත් ලෙස ජීප් රථ 30 ක් පමණ එකවර නතර කර ආහාරපාන ගැනීම, සනීපාරක්ෂක පහසුකම් ක්‍රමවත්ව සිදු කර ගැනීමට සුදුසු විවේකස්ථානයක් ඇති කිරීම පිලිබඳව විග්‍රහ කරන ලදි.

- මෙහි ප්‍රධාන මධ්‍යස්ථානයම පාරිසරික වශයෙන් කිසිදු හානියක් සිදු නොවන ආකාරයට පරිසර තත්ව යටතේ නිර්මාණය වන අතර තොරතුරු කවුන්ටරයක් ද,ආපනශාලාවක් ද, භාණ්ඩ අලෙවිසලක් ද වශයෙන් ප්‍රධාන කොටස් 03 ක් යටතේ මෙම නැරඹුම් මධ්‍යස්ථානය ක්‍රියාත්මක කරන බව විග්‍රහ කරන ලදි.

- මෙහි නිර්මාණ කටයුතු වලදී පාරිසරික වශයෙන් කිසිදු හානියක් සිදු නොවන ආකාරයට නිර්මාණය කරන බව ද ප්‍රකාශ කරන ලදි.

- පටනංගල මුහුද,වැව සහ ගොඩනැගිල්ල අවට පරිසරය ආවරණය වන ලෙස ඇවිදින මංතීරුවක් ලෙස ද, විවෘත ගොඩනැගිල්ලක් ලෙසද, මෙහි උඩ තට්ටුවට යා හැකි අතර, එය නැරඹුම් මැදිරියක් ලෙස සකස් කිරීමටත් මෙමගින් කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි.

- මෙහි බලශක්තිය සම්පූර්ණයෙන් සූර්යබල ශක්තිය මගින් සිදු වන අතර ඊට අදාල සූර්ය පැනල ගොඩනැගිල්ල මතුපිට සකස් කරන බව ද ප්‍රකාශ කරන ලදි.

- මෙම සංචාරක විවේකස්ථානය තුල ආපනශාලාවක්, ආහාර සකසන ස්ථානයක් ,තොරතුරු ලබා ගත හැකි මධ්‍යස්ථානයක්,කෞතුකාගාරයක්,වෙළද භාණ්ඩ හා සැමරුම් අලෙවි සැලක් ලෙස මෙහි පැති පෙනුම විවෘත,ස්වභාවික වාතාශ්‍රය සම්පූර්ණවම මධ්‍යස්ථානය හරහා ගමන් කරන ලෙසට නිර්මාණය කරන බව ප්‍රකාශ කරන ලදි. එසේම විවෘත ප්‍රදේශයේ ආසන සහිත විවේකී ස්ථානයක් ඉදි වන බවට පැහැදිලි කරන ලදි.

- තවද මෙම මධ්‍යස්ථානය අධීක්ෂණය සඳහා ඊට යාබදව වනජීවී කීට්ටු කාර්යාලයක් ස්ථාපිත කිරීමට නියමිතය.

<u>ව්‍යාපෘති සම්බන්ධීකාරක ආචාර්ය ලක්ෂ්මන් පීරිස් මහතා</u>

- මෙම ව්‍යාපෘතිය පිළිබද ඔබගේ විවෘත අදහස් යෝජනා ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

- තවද මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමේදී පරිසර සංරක්ෂණය පිලිබඳව, සතුන්ට හා ශාක වලට සිදුවන හානි අවම වන ලෙසට හා ඉදිකිරීම් කටයුතු සිදු කරන අයට සහ සංචාරකයින්ට හානියක් නොවන පරිදි ආරක්ෂිතව හා පරිසර හිතකාමීව කටයුතු කිරීමට සැලසුම් කරන ලද බව ප්‍රකාශ කරන ලදි.

<u>වෙරළ සංරක්ෂණ සහකාර අධ්‍යක්ෂ - බී.කේ.ටී.ඉඳුනිල් මහතා</u>

- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කි.මි. 1620 වෙරළ කළාපයක් සංරක්ෂණය වන අතර, මෙම කි.මී.1620 ක වෙරළ කළාපයේ වෙරළ කාණ්ඩ කර ඇති බවත්,එමගින් 105 ක් වර්ෂ 2018 වන විට වෙරළ කළාප කර සංරක්ෂණය වන බවත්,මෙම කාර්යයට එකග වන බවත් ප්‍රකාශ කරන ලදි.

- අපගේ අණපනත් පරිදි වෙරළ කළාපයක සංවර්ධන කාර්ය සිදු කරන්නේ නම් දෙපාර්තමේන්තු අනුමැතියක් තිබිය යුතු බව ද ප්‍රකාශ කරන ලදි.

- එමෙන්ම යාල කළාප කොටස ගොඩේකළපුව සිට පානම ප්‍රදේශ වෙරළ කළාපය මීටර 300 ලෙස දක්වා ඇති බවත්,මෙහි අදහස මීටර 35 එළියේ යම් සංවර්ධන කාර්යයක් සිදු වේ නම්, ඔවුන්ගේ අනුමැතිය අවශ්‍ය බවත්, මීටර 300 සීමාව තුලට ඇතුලත් වන බැවින් අවම වශයෙන් මීටර 10 ක් වත් දුර තිබිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

- ජාතික උද්‍යානය යටතේ සංවර්ධන කාර්යය අනුව සියළුම පහසුකම් සැකසුම් වනජීවී නීතීරීතී යටතේ සිදු වන බවත්, එහි ගැටළු නොපවතින බවත් ප්‍රකාශ කරන ලදි.

- ඉල්ලීමක් වශයෙන් සංවර්ධන කාර්යය අපගේ දෙපාර්තමේන්තුව අනුව කළ යුතු කාර්යක් බව මෙම කාර්ය සම්බන්ධව යෝජනාවක් අපගේ උපදේශන සමාගමට යොමු කරන ලෙසද ප්‍රකාශ කරන ලදි.

- නැවත ඉල්ලීමක් ලෙස මෙම සංවර්ධන කාර්ය සිදු කරගෙන යන විට වෙරළේ සිට ගොඩබිම දෙසට දුර පවත්වා ගෙන යන ලෙස ඉල්ලීම් කරන බවත්, හානියක් නොවන පරිදි සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

අධ්‍යක්ෂ (මෙහෙයුම්) - රන්ජන් මාරසිංහ මහතා

- දැනට පටනංගල පවතින තත්වය තුළින් විශාල ගැටළු රාශියකට මුහුණ පෑමට සිදු වන බවත් මෙය ඉදිකිරීමේදී ද අමතර ගැටළු උද්ගත වන බවත් ප්‍රකාශ කරන ලදි.

- මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේදී අනිවාරයෙන්ම මීටර 300 සීමාව මට්ටමින් නිර්මාණ විය යුතුද යන බවත් ප්‍රකාශ කරන ලදි.

වෙරළ සංරක්ෂණ සහකාර අධ්‍යක්ෂ - බී.කේ.ටී.ඉදුනිල් මහතා

- මෙවැනි අවස්ථාවක පරිසර තත්ව ඇගයීමක් කළ යුතු බවත්, මීටර 300 ක දුර පවත්වා ගෙන යාම වැදගත් වන බවත්, පුද්ගලික ඉදිකිරීමකදී නම් අනිවාර්යෙන්ම මීටර 300 අනිවාර්ය කාර්යක් බවත්,පොදු අවශ්‍යතාවයකදී මෙයට ඉඩ ලබා දිය හැකි බවත් මෙහි ප්‍රශ්නයක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදි.

වාස්තු විද්‍යා උපදේශක - ඉසුරු ද සොයිසා මහතා

- වෙරළ සංරක්ෂණ සහකාර අධ්‍යක්ෂ තුමා පැවසූ පරිදි 2017 වර්ෂයේ පරිසර තත්ව ඇගයීමක් කල බවද මේ පිලිබඳව සංවාද කල බවත්, එකල නීතියට අනුව මීටර 50 ඇතුළත ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදි.ඒ අනුව එම සැලසුම මීටර 50 බැහැර වන පරිදි සිදු කිරීමට අනුමැතිය ලැබිණි.වර්තමාන සැලසුම එම නීතියට යටත්ව සිදු කර ඇත.

වෙරළ සංරක්ෂණ සහකාර අධ්‍යක්ෂ - බී.කේ.ටී.ඉදුනිල් මහතා

- 2018 වර්ෂයෙන් පසු මීටර 50 - මීටර 300 වූ බවත්, පරිසර තත්ව ආරක්ෂා විය යුතු නිසා මීටර 300 සීමාවෙන් ඔබ්බට යා යුතු බව ප්‍රකාශ කරන ලදි.

ව්‍යාපෘති කළමණාකරු - ධනුෂ්ක මහතා

- මෙම ව්‍යාපෘතිය ලබන වසර තුල ජූලි වල අවසන් වන බවත් එබැවින් සියළු නිරාකරණය කිරීම් කඩිනමින් විසදා ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

අධ්‍යක්ෂ (මෙහෙයුම්) - රන්ජන් මාරසිංහ මහතා

- මෙය ඉදිකිරීමේදී 100 % සංරක්ෂණ අවශ්‍යතාවය සැලකිය යුතු බවත්,දැනට පවතින අඩුපාඩුව හේතුවෙන් ගැටළු රැසක් පැන නැගී ඇති බැවින් මෙය ඉදිකිරීම අත්‍යවශ්‍ය වන බවත්,යාල ප්‍රසිද්ධ ස්ථානයක් වන අතර, මෙහි කීර්ති නාමය රැකගනිමින් ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස මෙය සිදු කරගෙන යාමට අවශ්‍ය වන බවත් ප්‍රකාශ කරන ලදි.

- ආසියානු සංවර්ධන බැංකුවෙන් මීට පෙර සියළුම උද්‍යාන වල පාහේ සංචාරක මධ්‍යස්ථාන නිම කල බවත්,එහෙත් එම මධ්‍යස්ථාන සඳහා සංචාරකයින් නොයන බවත්,එයට හේතුව ඒ තුළ විශේෂයෙන් නිරීක්ෂණය කිරීමට තරම් දර්ශන නොමැති වීම බව පැහැදිලි කල අතර මෙහි වෙනස මෙම මධ්‍යස්ථානය තුළ නැරඹීමට තරම් විශේෂිකරණය වූ අවස්ථාවන් බිහි වීම බව පැහැදිලි කරන ලදි.
- යාල ජාතික උද්‍යානයේ විවේකීව සිටින මැණික් ගඟ පරණතොටුපල සහ පටනංගල අතරින් සංචාරකයින් බොහෝ දෙනෙක් රැදෙන සහ ආකර්ෂණීය ස්ථානය ලෙසට සුදුසුම ස්ථානය පටනංගල බව ප්‍රකාශ කරන ලදි.

වෙරළ සංරක්ෂණ සහකාර අධ්‍යක්ෂ - බී.කේ.ටී.ඉඳුනිල් මහතා

- ප්‍රාදේශීයව මෙම ව්‍යාපෘතිය සම්බන්ධව කිසිදු ප්‍රශ්නයක් නොමැති බවත්,යෝජනාවක් ඉදිරිපත් කරන ලෙසත්,කඩිනමින් මේ පිළිබඳව කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදි.

ආචාර්ය පිලපිටිය මහතා

- මාස තුනක් ඇතුළත මෙම ප්‍රශ්නය විසදා ගත හැකිද යන්න වෙරළ සංරක්ෂණ සහකාර අධ්‍යක්ෂ තුමාගෙන් විමසන ලදි.

වෙරළ සංරක්ෂණ සහකාර අධ්‍යක්ෂ - බී.කේ.ටී.ඉඳුනිල් මහතා

- හැකියාව පවතින බවත්, යෝජනාව ඉදිරිපත් කල පසු එය විසදිය හැකි බවත් ප්‍රකාශ කරන ලදි.

තිස්සමහාරාම ජීප් හිමියන්ගේ සංගමය

- මෙය හොද කාර්යක් බවත්,මෙය සිදු කරගෙන යාමේදී ප්‍රශ්න පැමිණිය හැකි බවත් මේ පිළිබඳව පැහැදිලි දැනුවත් කිරීමක් සිදු කරන ලෙසත්, මෙය ඉදිරියට කරගෙන යන්නේ කවුද, කොහොමද යන ලෙස දැනුවත්භාවය අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදි.

අධ්‍යක්ෂ (මෙහෙයුම්) - රන්ජන් මාරසිංහ මහතා

- මෙය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කරන කාර්යක් බවත්,මෙම කාර්ය සදහා මුදල් භාන්ඩාගාර හරහා ලෝක බැංකුවෙන් දෙන ණය ආධාරයෙන් බවත් රජයේ මුදල් පරිහරණය ලෝක බැංකු නිර්නායකයන් යටතේ සිදු වන බවත්,මෙම ඉදිකිරීම කොන්ත්‍රාත් පදනම මත සිදු කිරීමට ඇති බව සහ පරිපාලනය පුද්ගලික ආයතනයකට නොදෙන බවත්,මෙහි අයිතිය වනජීවී සංරක්ෂණ දෙපාරත්මේන්තුව අධ්‍යක්ෂ ජනරාල් තුමා යටතේ බවත් මෙහි සේවා සැපයීම සදහා කිහිපදෙනෙකු බාහිරව බදවා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදි.

- එසේම දැනට මෙය රජයේ නීත්‍යානූකූල ටෙන්ඩරයක් මත සිදු වන බවත් ප්‍රකාශ කරන ලදි.

ආචාර්ය පිලපිටිය මහතා

- මෙම කාර්ය සදහා ලෝක බැංකුව මුදල් ලබා දෙන බවත්, සංරක්ෂණයට හා කළමනාකරණයට අදාල තීරණ ගැනීම ශ්‍රී ලංකා රජයේ වනජීවී හා වනසංරක්ෂණ දෙපාර්තමේන්තු තිරණය කල යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

ව්‍යාපෘති කළමණාකරු - ධනුෂ්ක මහතා

- මෙහි තුන්වන පාර්ශවය වශයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මෙය ලබා දෙන බවත්,එමගින් මෙය පාලනය වන බවත් ප්‍රකාශ කරන ලදි.ඉදිකිරීම් වලදී කිසියම් ගසක් වත් ඉවත් නොකරන බවත්,මධ්‍යස්ථ ප්‍රමාණයේ ගසක් ඉවත් කළද එය නැවත රෝපණය කිරීමට කටයුතු කරන බවත්, ඉදිකිරීම් අධීක්ෂණය ක්‍රමානුකූලව සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදි.

තිස්සමහාරාම ස්වාධීන ජීප් හිමියන්ගේ සංගමය

- මෙම විවේකස්ථානය සදහා සංචාරකයින් විශාල පිරිසක් පැමිණෙන බවත්, මාගේ අදහස විදේශිකයන්ගේ සුබ සාධනය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි විය යුතු යන්නය. එහිදී මෙම ස්ථානයේ සන්නිවේදනය ඉතා දුර්වල බවත් සන්නිවේදන පහසුකම ප්‍රභල කර දෙන ලෙසත් ආවරණය වී බහිස්‍රාවීය කටයුතු සිදු කර ගැනීමට ඉඩ සලසා දෙන ලෙසත්, ටොයිලට් ප්‍රමාණය වැඩි කරන ලෙසත්, ප්‍රකාශ කරන ලදි.

- තවද දැනට ජීප්රථ ප්‍රමාණය අඩු වී යන බවත්, ඒ සදහා ජීප්රථ ලබා ගැනීමට සහන ක්‍රමයක් ලබා දෙන ලෙසත් ඉල්ලීම් කර අතර, ජීප්රථ රැකගෙන ඉදිරියට යැමට අවස්ථාව සලසා දෙන ලෙසත් සංචාරක ක්ෂේත්‍රය දියුණුවනවාසේම මෙම ව්‍යාපාරය රැක ගැනීමට ලෝක ආධාරයෙන් සහනයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි.

__ආචාර්ය පිලපිටිය මහතා__

- ලෝක බැංකුව කියන්නේ වානිජ බැංකුවක් නොවන බවත්,මෙමගින් ණය ආධාර ලබා දෙන්නේ පුද්ගලයන්ට නොව රජයට පමණක් බවත්, එමනිසා වනජීවී සංරක්ෂණ දායකත්වයට ලබා දුන්නද, සෆාරි ජීප්රථ ගැනීම වැනි පුද්ගලික කටයුතු සඳහා මෙම ණය ආධාර නොදෙන බව ප්‍රකාශ කරන ලදි.

__අධ්‍යක්ෂ (මෙහෙයුම්) - රන්ජන් මාරසිංහ මහතා__

- තිස්සමහාරාම ජීප්රථ හිමියන්ගේ සංගමය මගින් ඉදිරිපත් කළ ගැටළු වලට විසඳුම් මෙහි එක් කොට්ඨාසයක් තුල පවතින බවත්,

- සන්නිවේදන ගැටළුව සංකීර්ණ බවත්,නමුත් එය අනුමත කරන බවත්, සන්නිවේදන පහසුකමේ වාසිය මෙන්ම මේ තුලින් උද්‍යානයේ අභ්‍යන්තර වීඩියෝ දර්ශන අනතර්ජාලය හරහා ලබා දිම තුලින් සංචාරක ප්‍රවර්ධන අඩු වන බවත් ප්‍රකාශ කල අතර,දැනට ෆයිබර් ඔප්ටික් කේබල් ස්ථාපිත කර ඇති අතර, එමගින් සන්නිවේදන පහසුකම ඉදිරියට සිදු කරගෙන යාමට පහසු වන බවත්, ඉදිරියේදී **Wi-fi** ලබා දීමට හැකියාව ඇති බවත්, වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

- එසේම විල්පත්තු ජාතික උද්‍යානය වෙනුවෙන් මොබයිල් ඇප් එකක් සකසන බවත් එය සාර්ථක වුවහොත් එය ද මෙම උද්‍යානයට ආදේශ කරන බවත් ප්‍රකාශ කරන ලදි.

__තිස්සමහාරාම ජීප් හිමියන්ගේ සංගමය ලේකම්__

- **Travel Bubble** හේතුවෙන් මේ වන විට පැමිණෙන දේශීය සංචාරකයන් හට මෙම පටනංගල විවේකස්ථානයට යාමට නොහැකි වී ඇති අතර, මෙම ගොඩනැගිල්ල ඉදිකරන කාලය තුළ කිසිදු සංචාරකයකුට මේ ප්‍රදේශයට යාමට අවසර නොමැති ද යන්නත්, මේ සඳහා ඉදිරියේදී වෙනත් විකල්පය ස්ථානයක් ලබා දෙනවාද යන්නත් විමසා සිටින ලදි.

__අධ්‍යක්ෂ (මෙහෙයුම්) - රන්ජන් මාරසිංහ මහතා__

- මෙම ගැටළුව මෙම ස්ථානයේම කළමනාකරණය කර ගැනීමට කටයුතු සිදු කරන ලෙසත්,මෙම ව්‍යාපෘතිය සඳහා වැඩි කාලයක් නොගන්නා බවත්, **Travel Bubble** සංකල්පය සිදු කරනු ලබන්නේ රටේ ආර්ථිකය පවත්වා ගැනීමට විදේශිකයන් ගෙන්වීම සඳහා බවත් සෞඛ්‍ය අංශ හා සංචාරක ප්‍රවර්ධන අංශ වෙතින් අප වෙත ලැබුනු නියෝගය මත මෙය සිදු කරන බව ප්‍රකාශ කරන ලදි.

වාස්තු විද්‍යා උපදේශක - ඉසුරු ද සොයිසා මහතා

- මෙම ව්‍යාපෘතිය සදහා පටනංගල එලිමහන් භූමියෙන් අඩු ප්‍රමාණයක් පමණක් වැය කරන බව සහ මෙම ව්‍යාපෘතිය සිදු කරන ලද කොටස ආවරණය වන පරිදි අනිත් කොටස භාවිතයට ගත හැකි පරිදි විවෘතව පවතින බවත් ප්‍රකාශ කරන ලදි.

සහකාරඅධ්‍යක්ෂ (ඌව) - ඩබ්.ඒ.ඒ.ඩී.යූ.ඉන්ද්‍රජිත් මහතා

- පටනංගල මාර්ගය ඔස්සේ වැසි ජලය ගලා යන බවත් එමගින් මාර්ගය අබලන් විය හැකි බැවින් මෙම ප්‍රදේශය අවලස්සන විය හැකි බවත් ප්‍රකාශ කරන ලදි.

වාස්තු විද්‍යා උපදේශක - ඉසුරු ද සොයිසා මහතා

- වැසි ජලය ගලා යන ස්ථාන ක්‍රමවත්ව සැකසීමට සැලසුම් කර ඇති බවත් ගොඩනැගිල්ල පොළොව මට්ටමේ සිට අඩි 3 ක් උසින් සකසන බවත් ප්‍රකාශ කරන ලදි.

සහකාරඅධ්‍යක්ෂ (ඌව) - ඩබ්.ඒ.ඒ.ඩී.යූ.ඉන්ද්‍රජිත් මහතා

- මෙහි වැලි සහිත මඩ පොළොව යන්ත්‍ර මගින් සකස් කිරීම තුලින් මෙම ස්ථානය අවලස්සන විය හැකි බවත්, එමෙන්ම මෙම නිමැයුමෙන් පසු අලි සංක්‍රමණය වීම වැඩි වනවා සේම වදුරු, රිලව් ප්‍රශ්නය,මෙම සතුන් මගින් අපවිත්‍ර වීම්, දුගද ව්‍යාප්ත වීම් වැනි ප්‍රශ්න ද, නඩත්තු කිරීමේ ගැටළු පැමිණෙන බවත්, පුද්ගලික ආයතනයකට පිරිසිදු කිරීම් කටයුතු භාර දෙන්නේ නම් එය දිගටම කර ගෙන යා යුතු බව ද ප්‍රකාශ කරන ලදි.

- එමෙන්ම රාත්‍රී කාලය තුලදී මෙහි ඇතුළෙහි ආරක්ෂාව සෘජුවම උද්‍යාන භාරකරු සහ මා වෙත පැවරෙන අතර, ඒ සදහා ආරක්ෂාව සහ විකල්පයක් අවශ්‍ය වන බවත් ප්‍රකාශ කරන ලදි.

- එමෙන්ම කොන්ත්‍රාත්තු කාලය නියමිත කාල සීමාවේදී නිම කලේ නැතිනම් සිදු කරන්නේ කුමක් ද යන ප්‍රශ්නය ද ඉදිරිපත් කරන ලදි.

වාස්තු විද්‍යා උපදේශක - ඉසුරු ද සොයිසා මහතා

- මෙහි වදුරු,රිලව් ප්‍රශ්නයට විවෘත තැන් දැලකින් ආවරණය කිරීමට හැකි බව යෝජනා කරන ලදි.

**අධ්‍යක්ෂ (මෙහෙයුම්)  - රන්ජන් මාරසිංහ මහතා**

- මෙහි වදුරු,රිලව් ගැටළු  ගැන සහ නඩත්තුව පිරිසිදු කම වැනි ගැටළු ගැන ක්‍රමවේදයක් සකස් කළ ගත යුතු අතර, සවස 6.00 න් පසුව එහි සේවය නිමා කරන අතර, රාත්‍රී කාලයේ එහි කෙනෙකු රදවා තැබීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි.

**ව්‍යාපෘති කළමණාකරු   - ධනුෂ්ක මහතා**

- කොන්ත්‍රාත්තුව ප්‍රමාද වුවහොත් නිතීමය පියවර ගන්නා බව ප්‍රකාශ කරන ලදි.

**සහකාරඅධ්‍යක්ෂ (ඌව)  - ඩබ්.ඒ.ඒ.ඩී.යූ.ඉන්ද්‍රජිත් මහතා**

- කොන්ත්‍රාත් කාලය ප්‍රමාද වීමට හැකි බවත්, කාල සීමාව පසු විය හැකි බවත් ප්‍රකාශ කරන ලදි.

**අධ්‍යක්ෂ (මෙහෙයුම්)  - රන්ජන් මාරසිංහ මහතා**

- මෙය කෙටි කාලීනව සිදු කරන  ව්‍යාපෘතියක් බව ප්‍රකාශ කරන ලදි.

**තිස්සමහාරාම ස්වාධීන ජීප් හිමියන්ගේ සංගමය**

- මෙවැනි ස්ථානයක් දිගින් දිගටම අවශ්‍ය වූ බවත්, මෙවැනි ඉදිකිරීමක් සම්බන්ධව ස්තුතිය ප්‍රකාශ කරන බවත්, තවත් ඉල්ලීමක් ලෙස උද්‍යාන සංචාරය කරන කාල සීමාව නතර කර තැබෙන දහවල් 12- 02 ත් අතර කාල සීමාව සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීම් කරන ලදි.

**අධ්‍යක්ෂ (මෙහෙයුම්)  - මාරසිංහ මහතා**

- පියවර 3 ක් යටතේ සංචාරක කටයුතු සිදු කිරීමට තීරණය කල වකවානුව තුල ජීප්රථ සංගම් වල ඉල්ලීම ද පරිදි  මෙම උද්‍යාන සංචාරය කරන කාල සීමාව නතර කර තැබෙන දහවල් 12 - 02 ත් අතර කාල සීමාව තුළ සත්ව  හිංසාව අවම  වන  බවත්, සතුන්ගේ චර්යා නිදහස  සීමා නොකරන බවත් ජාත්‍යන්තරව වැදගත් පණිවුඩයක් කියැවෙන බවත් මෙම කාලය වෙනස් කිරීම  පිළිබදව අදාළ අංශ සමග අවසන් තීරණයකට එළඹීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි.

**ජීප්රථ රියදුරකු**

- උද්‍යාන සංචාරය කරන කාල සීමාව නතර කර තැබෙන දහවල් 12- 02 ත් අතර කාල සීමාව සංශෝධනයකිරීමට හැකියාවක් ඇති බවත්,එමගින් හානියක් නොපැමිණෙන බවත් එය සිදු කර දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදි.

ආචාර්ය පිලපිටිය මහතා

- ලෝක බැංකුව මගින් මෙලෙස උද්‍යාන තුල වාහන ධාවනය නතර කරන තැබෙන දහවල් 12- 02 ත් අතර කාල සීමාව තීරණය කල බවට වැරදි ප්‍රචාරයක් ඇති බවත්, ලෝක බැංකුව එවැනි ප්‍රාදේශීය කරුණු සදහා මැදිහත් නොවන බවත් ව්‍යාපෘති කාර්ය සදහා මුදල් ලබා දීම පමණක් එමගින් සිදු කරන බව ප්‍රකාශ කරන ලදි.

ස්වේච්ඡා මාර්ගෝපදේශක - ඉෂාන් මහතා

- මෙය අත්‍යවශ්‍ය කාර්යක් බවත්, කැමැත්ත ප්‍රකාශ කරන බවත්, එමෙන්ම මෙහි පවතින පටනංගල මාළු වාඩි ගැන නීතීමය පද්ධතිය කුමක්ද? යන බව, ධීවර වරාය ගැන ප්‍රශ්න ඇති හැකි බවත්, එයට ගන්නා පියවර කුමක් ද? යන බව, මෙම සංචාරක විවේකස්ථානය අසළම දිගින් දිගටම ධීවර කටයුතු සිදු වන බවත්, මාළු රැගෙන යන එන ලොරි රථ මෙම සංචාරක විවේකස්ථානය අසළින් ගමන් ගන්නා බවත්, මෙහි නීතිමය පියවර කුමක් ද? යන ලෙසද ප්‍රකාශ කරන ලදි.

අධ්‍යක්ෂ (මෙහෙයුම්) - මාරසිංහ මහතා

- වනජීවී පනත ප්‍රකාරව මෙය සම්ප්‍රදායිකව සිදු වන දෙයක් බවත්, මෙම ධීවර වරාය තුළින් යැපෙන ධිවර පවුල් ප්‍රමාණයක් සිටින අතර මාස 06 කින් පසු මෙය ඉවත් කර ගැනීමක් සිදුවන බැවින් විශේෂ ගැටළුවක් උද්ගත නොවේ.එය යෝජිත සංචාරක මධ්‍යස්ථානයට බාධාවක් නොවන පරිදි පවත්වා ගැනීමට අධීක්ෂණය කල යුතුය.

සංවර්ධන නිලධාරී - එන්.එදිරිවීර මහතා

- පටනංගල වෙරළ තීරයට කැස්බැවන් පැමිණෙන බව වාර්තා වී තිබෙන අතර,මේ ව්‍යාපෘතිය තුළින් එම සතුන් හට බාධාවක් පැමිණිය හැකි ද යන බව ප්‍රකාශ කරන ලදි.

ව්‍යාපෘති සම්බන්ධීකාරක ආචාර්ය ලක්ෂ්මන් පීරිස් මහතා

- මෙම ව්‍යාපෘතිය මගින් එයට කිසිදු බලපෑමක් නොමැති බවත්,සවස 6.00 න් පසු කිසිදු කාර්යක් මෙහි සිදු නොවන බවත් ප්‍රකාශ කරන ලදි

හෝටල් හිමියන්

- මෙම ඉදිකිරීමෙන් පසු මෙහි ප්‍රධාන අපවහන හා අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම කෙසේද යන්න ප්‍රශ්න කරන ලදි.

## <u>ව්‍යාපෘති සම්බන්ධීකාරක ආචාර්ය ලක්ෂ්මන් පීරිස් මහතා</u>

- මෙම ප්‍රදේශය තුළ සහ උද්‍යානය ඇතුළත කිසිදු බාහිර ද්‍රව්‍යයක් එක් වීමට ඉඩ නොතබන අතර,කැළි කසළ බඳුන් මෙහි නොතබන බවත්,සංචාරකයින් රැගෙන එන සියළු දෑ ඔවුන්ම රැගෙන යාම මෙහි ක්‍රමවේදය විය යුතු බව ද ප්‍රකාශ කරන ලදි.

## <u>උද්‍යාන භාරකරු (යාල) ජාතික උද්‍යානය - වී.කේ.එම්.විද්‍යාරත්න මහතා</u>

- මෙම කටයුත්ත අත්‍යවශ්‍ය ප්‍රධානම කටයුත්තක් බවත්, මෙය වැඩිදියුණු කර ගනිමින් සංවර්ධනය කරා යාමට අවශ්‍ය වන බවත්, මෙම කාර්ය සඳහා ස්තූතිය පුද කරමින් පැමිණි සියළුම නිලධාරීන්, බාහිර පාර්ශවයන් හට ස්තූතිය පුද කරමින් සාකච්ඡාව අවසන් කරන ලදි.

**ප.ව. 1.30 වන විට සාකච්ඡාව අවසන් කරන ලදි...***